ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1978 නොවැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 60 යි.
තැපැල් ගාස්තුව : ශත 25 යි.

**1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනත**

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 90/78.

**අභියාචනාධිකරණය විසින් අංක 1/78 දරන ඉල්ලීම සම්බන්ධයෙන් දෙන ලද නඩු තීන්දුව හේතු කොට ගෙන ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත අදාළ වන්නා වූ විෂය පථය පිළිබඳව පැන නැගී ඇති ඇතැම් සැක දුරු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ කාර්යය සඳහා ව්‍යවස්ථාදායකයේ අභිප්‍රාය නිසැකව ප්‍රකාශ කිරීම පිණිස ද, ඉහත කී පනත සංශෝධනය කිරීම පිණිස ද එකී ඉල්ලීම සම්බන්ධයෙන් දෙන ලද නඩු තීන්දුව සහ නිකුත් කරන ලද රිට් ආඥාව කෙසේ වුව ද එකී පනත යටතේ පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියෙහි පවත්වන ලද පරීක්ෂණ කටයුතු වලංගු කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

1978 මාර්තු මස 30 වන දින අංක 310/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1978 මාර්තු මස 29 වන දින දරන අධිකාර පත්‍රය මගින් ජනාධිපතිවරයා විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 (1) වන වගන්තිය යටතේ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරන ලද හෙයින් ද: පූර්විකාව.

ඉහත කී පනත පැනවීමේ දිනයට පෙරාතුව වූ 1970 මැයි මස 28 වන දිනයෙන් ආරම්භව 1977 ජූලි මස 23 වන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදයට අදාළ කාරණා පිළිබඳව පරීක්ෂා කිරීමට ඉහත කී කොමිෂන් සභාවට බලය පවරන්නා වූ ඉහත කී අධිකාර පත්‍රයෙන්, ඉහත කී පනත පැනවීමේ දිනයට පෙරාතුව වූ කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට, වාර්තා කිරීමට සහ නිර්දේශ කිරීමට කොමිෂන් සභාවට බලය පැවරීමේ හේතුවෙන් එකී අධිකාර පත්‍රය ඉහත කී පනතේ බලය ඉක්මවන බව, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අංක 1/78 දරන ඉල්ලීමේ දී, අභියාචනාධිකරණය විසින් තීරණය කොට කොමිෂන් සභාවට විරුද්ධව තහනම් රිට් ආඥාවක් නිකුත් කර ඇති හෙයින් ද:

ඉහත කී පනත පැනවීමට පෙර වුව ද පසුව වුව ද කවර වූ හෝ කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන්, විශේෂයෙන්ම 1970 මැයි මස 28 වන දිනයෙන් ආරම්භ ව 1977 ජූලි මස 23 වන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදය සම්බන්ධයෙන්, පරීක්ෂා කිරීමට, තොරතුරු ලබා ගැනීමට සහ ඒ පනතේ විධිවිධාන සලස්වා ඇති සියලු බලතල ක්‍රියාත්මක කිරීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා අධිකාර පත්‍රයක් නිකුත් කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම ව්‍යවස්ථාදායකයේ අභිප්‍රාය වන හෙයින් සහ එහි අභිප්‍රාය වූ හෙයින් ද:

ඒ .7/59—12,325 (78/11)

යම් අග්‍රාමාත්‍යවරයකු, අමාත්‍යවරයකු, නියෝජ්‍ය අමාත්‍යවරයකු, ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු ඇතුළුව ඉහත කී පනතේ අර්ථ කථනය කරනු ලැබ ඇති පරිදි වූ යම් රාජ්‍ය නිලධරයකුගේ ද යම් අධිකරණ ධුරයක් දරන්නකුගේ ද කොමිෂන් සභාවේ විෂය කරුණු වල සඳහන් යම් කාල පරිච්ඡේදයක් ඇතුළත එකී යම් ධුරයක් දැරූ තැනැත්තකුගේ ද ක්‍රියා කලාපය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට, තොරතුරු ලබා ගැනීමට සහ එකී සියලු බලතල ක්‍රියාත්මක කිරීමට, ඒ තැනැත්තා ඒ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට වගකිව යුතු වුව ද නොවුව ද, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා අධිකාර පත්‍රයක් නිකුත් කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම ව්‍යවස්ථාදායකයේ අභිප්‍රාය වන හෙයින් සහ එහි අභිප්‍රාය වූ හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ ප්‍රකාශ කොට පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන අධිකාර පත්‍රයක්, මේ පනත ආරම්භ වූ දිනයට කලින් වූ යම් කාල පරිච්ඡේදයක් ද ඇතුළුව කවර වූ හෝ කාල පරිච්ඡේදයකට අදාළ විය හැකි ය." තව ද

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "බලය තිබිය යුතුය" යන වචන වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :—

"බලය තිබිය යුතු ය. තව ද ඒ අනුව, (1) වන උප වගන්තියේ දක්වා ඇති ආකාරයට හෝ ඊට සාරානුකූල වන ආකාරයට, එම උපවගන්තියේ දක්වා ඇති කාරණා එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ඒ කාරණා සියල්ලම හෝ සම්බන්ධයෙන් සීමා කිරීමකින් හෝ ප්‍රතිබාධකයකින් තොරව, පරීක්ෂා කොට වාර්තා කළ යුතු කාරණා පිළිබඳව එසේ සඳහන් කරනු ලබන විෂය කරුණුවල සඳහන් විය හැකි ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ) ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ගිණුමට අදාළ සටහන් ඇතුළත් බැංකුවේ යම් පොතක් හෝ ලේඛනයක්" යන වචන වෙනුවට "ගිණුමට අදාළ සටහන් ඇතුළත් බැංකුවේ හෝ ණය දෙන ආයතනයේ යම් පොතක් හෝ ලේඛනයක් හෝ එවැනි යම් තැනැත්තකු සමග වූ යම් ගනුදෙනුවකට අදාළ වෙනත් යම් ලේඛනයක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) "බැංකුවක කළමනාකාරවරයාට" යන වචන වෙනුවට "බැංකුවක හෝ ණය දෙන ආයතනයක කළමනාකාරවරයාට" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි හෝ සිදු කරන ලද යම් අපහාස වරදක් ම සම්බන්ධයෙන්, ඒ වරද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි හෝ සිදු කරන ලද අපහාස වරදක් වූවාක් මෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය, ඒ උපවගන්තියේ අගට පහත සඳහන් කොටස එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

"කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරනු ලබන කාරණය යම් අධිකරණයක යම් නඩු කටයුත්තක දී කෙළින් ම හෝ අන්‍යාකාරයකින් පැන නැගෙන හෝ පැන නැගීමට ඉඩ ඇති කාරණය ම වීමේ හෝ සාරානුකූලව එම කාරණය ම වීමේ හේතුව මත හෝ ප්‍රශ්නයට දෙන පිළිතුර නිසා හෝ ලේඛනය හෝ වෙනත් දෙය ඉදිරිපත් කිරීම නිසා වෙනත් යම් නඩු කටයුත්තක දී තමාට කෙළින් ම හෝ අන්‍යාකාරයකින් බලපෑමක් හෝ හානියක් සිදුවීමට ඉඩ ඇති වීමේ හේතුව මත, යම් ප්‍රශ්නයකට පිළිතුරු දීමට හෝ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට සහ පෙන්වීමට යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම සාධාරණ හේතුවක් ලෙස මේ වගන්තියේ කාර්ය සඳහා නොසැලකිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

*"කොමිෂන් සභාවේ සාමාජිකයන් ආදීන් ආරක්ෂා කිරීම.*

18. කොමිෂන් සභාවක යම් සාමාජිකයකු විසින් හෝ කවර වූ හෝ ආකාරයකින් කොමිෂන් සභාවකට සහාය වන වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ඒ සාමාජිකයා වශයෙන් නැතහොත් ඒ වෙනත් යම් තැනැත්තා වශයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට විරුද්ධව හෝ අපහාස කිරීම සම්බන්ධයෙන් හැර, ඒ වෙනත් තැනැත්තාට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, කොමිෂන් සභාවකට සහාය වන තැනැත්තකු යන්නට කොමිෂන් සභාවක් විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙක් හෝ කොමිෂන් සභාවක යම් නියමයක් ක්‍රියාත්මක කරන හෝ ක්‍රියාවේ යොදවන යම් තැනැත්තෙක් හෝ එවැනි නියමයකට අනුකූලව ක්‍රියා කරන යම් තැනැත්තෙක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියේ පෙනී සිටින යම් නීතිඥවරයෙක් හෝ 16 වන වගන්තිය යටතේ අනුමි දෙනු ලැබ නීතිඥවරයකු විසින් නියෝජනය කරනු නොලබන තැනැත්තෙක් හෝ ඇතුළත් වෙයි.".

*ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18අ හා 18ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම.*

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 18අ හා 18ආ වන වගන්ති ලෙස බල පැවැත්විය යුතු ය :—

*"කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් යටත් පිරිසෙයින් එක් සාමාජිකයකු වුව ද ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ විනිශ්චයකාරවරයකු වන අවස්ථාවක ඉල්ලීම් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මාරු විය යුතු බව සහ කොමිෂන් සභාවකට අදාළව අධිකරණ සතු බලතල.*

18අ. (1) මේ පනත යටතේ පිහිටුවන ලද හෝ මේ පනත යටතේ පිහිටුවන ලදැයි අදහස් කරනු ලබන හෝ යම් කොමිෂන් සභාවකට නැතහොත් එහි යම් සාමාජිකයකුට අදාළව අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම සහ ඒ කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයකු හෝ පාර්ශ්වකරුවකු වන ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම ඒ කොමිෂන් සභාව එසේ පිහිටුවන ලද අවස්ථාවේ දී නැතහොත් ඒ ඉල්ලීම එය වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ විනිශ්චයකාරවරයකු වන හෝ එසේ විනිශ්චයකාරවරයකුව සිටි යටත් පිරිසෙයින් එක් විනිශ්චයකාරවරයකුගෙන් හෝ ඒ කොමිෂන් සභාව සමන්විතව පැවැති අවස්ථාවක හෝ, එකී සාමාජිකයා කොමිෂන් සභාවක සාමාජිකයකු වශයෙන් පත් කරන ලද අවස්ථාවේ දී නැතහොත් ඉල්ලීම

ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී, ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වන හෝ එවැනි විනිශ්චයකාරවරයකුව සිටි අවස්ථාවක, ඒ ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මාරු වන්නේ ය. ඒ ඉල්ලීම සම්බන්ධයෙන් අභියාචනාධිකරණය සතු සියලු බලතල ශ්‍රේෂ්ඨාධිකරණයට ද තිබිය යුතු අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. තව ද ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අභියාචනාධිකරණයට කිසිම බලයක් හෝ අධිකරණ බලයක් නොතිබිය යුතු අතර අභියාචනාධිකරණය විසින් එවැනි බලයක් හෝ අධිකරණ බලයක් ක්‍රියාත්මක කිරීම ද නොකළ යුතු ය.

(2) පටහැනිව කුමක් සඳහන් ව ඇත ද,—

(අ) 2 (1) වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ ක්‍රියාත්මක කරනු ලබන්නේ යයි අදහස් කරනු ලැබීමේ දී ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අධිකාර පත්‍රයක් මගින් පිහිටුවා ඇති කොමිෂන් සභාවක් ඉදිරියෙහි හෝ එවැනි කොමිෂන් සභාවක් විසින් හෝ පරීක්ෂණ කටයුතු කිසිවක් පවත්වාගෙන යාම නැතහොත් එවැනි යම් කොමිෂන් සභාවක් විසින් යම් නියමයක් කිරීම, තීන්දුවක් දීම, වාර්තාවක් ඉදිරිපත් කිරීම, නිශ්චය කිරීමක්, තීරණයක් හෝ නිර්දේශයක් කිරීම නතර කරමින්, අත්හිටුවමින් හෝ තහනම් කරමින් ;

(ආ) එවැනි යම් කොමිෂන් සභාවක යම් නියමයක්, තීන්දුවක්, වාර්තාවක්, නිශ්චය කිරීමක්, තීරණයක් හෝ නිර්දේශයක් ඉවතලමින් හෝ වෙනස් කරමින්

කවර වූ හෝ අවස්ථාවක දී, කවර හෝ ආකාරයකින් යම් ආඥාවක් කිරීමට බලය හෝ අධිකරණ බලය කිසිම අධිකරණයකට නොතිබිය යුතු ය :

එසේ වුව ද (1) වන උපවගන්තියේ විධිවිධාන හේතු කොට ගෙන යම් ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මාරු වී ඇති අවස්ථාවක, ඒ අධිකරණය විසින් ඒ ඉල්ලීම පිළිබඳව අවසාන වශයෙන් නිශ්චයක් කරනු ලැබූ විට පමණක්, ස්වකීය නීත්‍යනුකූල අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඒ අධිකරණය විසින් කළ හැකි යම් ආඥාවක් ඒ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

එසේම තවදුරටත්, (1) වන උපවගන්තියේ විධිවිධාන හේතු කොට ගෙන යම් ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මාරු වී නොමැති අවස්ථාවක, අභියාචනාධිකරණය විසින් ඒ ඉල්ලීම පිළිබඳව අවසාන වශයෙන් නිශ්චයක් කරනු ලැබූ විට පමණක් ස්වකීය නිත්‍යානුකූල අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඒ අධිකරණය විසින් කළ හැකි යම් ආඥාවක් ඒ අධිකරණය විසින් කරනු ලැබිය හැකි නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලැබිය හැකි යම් ආඥාවකට අනුකූලව හා ඊට යටත්ව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවසාන වශයෙන් නිශ්චය කරනු ලැබූ විට පමණක් නැතහොත් අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී නම් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ඉකුත් වීමෙන් පසුව පමණක්, අභියාචනාධිකරණයේ ඉහත සඳහන් ආඥාව බලාත්මක විය යුතු ය.

සමගාමී නඩු කටයුතු පැවතීමේ හේතුවෙන් කොමිෂන් සභාවක පරීක්ෂණ කටයුතු නතර නොකළ යුතු බව.

18ආ. කොමිෂන් සභාවේ පරීක්ෂණයට විෂය වන යම් කාරණයක්, යම් අධිකරණයක් ඉදිරියේ සලකා බැලීම සඳහා හෝ තීරණය කිරීම සඳහා කෙළින් ම හෝ අන්‍යාකාරයකින් පැන නගින හෝ පැන නැගීමට ඉඩ ඇති කාරණය ම වීමේ හෝ සාරානුකූලව එම කාරණය ම වීමේ හේතුව මත යම් කොමිෂන් සභාවක පරීක්ෂණ කටයුතු නතර කරන්නා වූ ආඥාවක් කිසිම අධිකරණයක් විසින් නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 21අ වන වගන්තිය ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 21අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"අනනුකූලතා නොතකා මෙ පනතේ බලපෑම.

21අ. යම් අග්‍රාමාත්‍යවරයකු, අමාත්‍යවරයකු හෝ වෙනත් රාජ්‍ය නිලධරයකු විසින් කරන ලද හෝ සිදු කරන ලද

(අ) බලය අනිසි ලෙස හෝ අයථා ලෙස පාවිච්චි කරනු ලැබීම, මැදිහත් වීම, වංචා කිරීම, දූෂණය හෝ ඥාති සංග්‍රහය ;

(ආ) යම් තැනැත්තකුගෙන් දේශපාලන වශයෙන් පළිගැනීම ;

(ඇ) (i) යම් තැනැත්තකුට යම් පත්වීමක් දීමේ දී හෝ ඔහු මාරු කිරීමේ දී,

(ii) යම් තැනැත්තකුට යම් උසස්වීමක් දීමේ දී,

(iii) යම් තැනැත්තකුගේ සේවය අවසන් කිරීමේ දී

යම් අක්‍රමිකතාවක් ;

(ඈ) යම් ලිඛිත නීතියක් උල්ලංඝනය කිරීම සහ එහි ලා ඒ අග්‍රාමාත්‍යවරයා, අමාත්‍යවරයා හෝ රාජ්‍ය නිලධරයා කොතෙක් දුරට වගකිය යුතු ද යන්න ඇතුළුව යම් අග්‍රාමාත්‍යවරයකුගේ, අමාත්‍ය වරයකුගේ හෝ වෙනත් රාජ්‍ය නිලධරයකුගේ ක්‍රියා කලාපය, ඒ ක්‍රියා කලාපය පිළිබඳව පරීක්ෂා කිරීමට කොමිෂන් සභාවක් වෙත අධිකාරය, බලය හා අධිකරණ බලය පැවරීම 1946 ලංකා (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා) රාජසභා ආඥාවේ 46 (1) වන වගන්තියේ හෝ එහි වෙනත් යම් වගන්තියක විධිවිධානවලට හෝ 1972 මැයි මස 22 වන දින සම්මත කොට පනවන ලද ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන වගන්තියේ හෝ 106 (5) වන වගන්තියේ සහ වෙනත් යම් වගන්තියක විධිවිධානවලට අනනුකූල විය හැකි වුව ද අනනු කූල විය හැකිව තිබුණේ වුව ද නැතහොත් අනනු කූල වූ ලෙස තේරුම් ගනු ලැබිය හැකි වුව ද හෝ අනනුකූල ලෙස තේරුම් ගනු ලැබිය හැකිව තිබුනේ වුව ද එය නොතකා යම් කොමිෂන් සභා වක් විසින් පරීක්ෂා කිරීමට පූර්ණ අධිකාරය, බලය හා අධිකරණ බලය ඇති ලෙස මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් අධිකාර පත්‍රයක විධිවිධාන අර්ථ නිරූපණය කොට ඒ විධිවිධානවලට වලංගු භාවය දී ක්‍රියාත්මක කළ යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "යම් රාජ්‍ය නිලධරයකුගේ ක්‍රියා කලාපය" යන්නෙහි අර්ථ කථනයේ (ii) වන ඡේදයට ඉක්බිතිව ම ආරම්භව ඒ අර්ථකථනයේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(iii) යම් බලයක්, කටයුත්තක් හෝ අධිකාරයක් ක්‍රියාත්මක කිරීම හෝ කිරීම නැතහොත් ක්‍රියාත් මක කළේ යයි හෝ කළේ යයි අදහස් කරනු ලැබීම සම්බන්ධයෙන් වන විට සහ ඒ බලය, කටයුත්ත හෝ අධිකාරය මුවාවෙන් වුව ද නො වුව ද

යම් රාජ්‍ය නිලධරයකුගේ ක්‍රියා කලාපය ඇතුළත් වන අතර, අදාළ කාල පරිච්ඡේදය තුළ බලාත්මකව පැවති ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ එවැනි ක්‍රියා කලාපයක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ, ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ නැතහොත් කවර හෝ ආකාරයකින් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමේ බලය හෝ අධිකරණ බලය

කිසි ම අධිකරණයකට, විනිශ්චයාධිකාරයකට හෝ වෙනත් ආයතනයකට නොතිබෙන්නේ වුවද නොතිබුණේ වුව ද අදාළ කාල පරිච්ඡේදය තුළ බලාත්මකව පැවති ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ එවැනි යම් ක්‍රියා කලාපයක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට, ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට නැතහොත් කවර හෝ ආකාරයකින් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමට වෙනත් යම් පුද්ගල මණ්ඩලයක්, අධිකරණයක්, විනිශ්චයාධිකාරයක් හෝ ආයතනයක් වෙත බලය පවරා තිබෙන්නේ වුව ද තිබුණේ වුව ද, අදාළ කාල පරිච්ඡේදය තුළ දී බලපැවැත් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, ඒ තැනැත්තා හෝ ඒ තැනැත්තා අයත් වූ මණ්ඩලය හෝ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවා තිබූ ව්‍යවස්ථාදායකයට ඒ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් වගකිව යුතුව හෝ උත්තර දිය යුතුව සිටියේ හෝ සිටින්නේ වුව ද, කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා නිකුත් කරන ලද අධිකාර පත්‍රයෙහි ජනාධිපතිවරයා විසින් සඳහන් කරන ලද හෝ යම් තැනැත්තකු විසින් එවැනි කොමිෂන් සභාවක් වෙත ඉදිරිපත් කරන ලද, යම් රාජ්‍ය නිලධරයකු විසින් බලය අනිසි ලෙස පාවිච්චි කරනු ලැබීම හෝ බලය අයථා ලෙස පාවිච්චි කරනු ලැබීම, දූෂණය, යම් වංචාකාරී ක්‍රියාවක්, ඥාති සංග්‍රහය හෝ දේශපාලන පළිගැනීම් පිළිබඳ චෝදනා ද, ඊට ඇතුළත් වේ. ";

(2) "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"අමාත්‍යවරයා" යන්නට අග්‍රාමාත්‍යවරයා ඇතුළත් වේ.';

(3) "රාජ්‍ය නිලධරයා" යන්නෙහි අර්ථකථනයේ,—

(අ) (ii) වන ඡේදයෙහි "යම් රාජ්‍ය නිලධරයකු ; සහ" යන වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"අධිකරණ ධුරයක් හෝ අදාළ කාලයෙහි බල පැවැත්වෙන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කරන ලද නැතහොත් පිළිගන්නා ලද යම් ධුරයක් දරන්නකු ඇතුළුව යම් රාජ්‍ය නිලධරයකු ; සහ";

(ආ) (iii) වන ඡේදයෙහි "සේවානියුක්තයකු" යන වචනය ඉවත් කොට ඒ වෙනුවට, "සේවානියුක්තයකු, ඒ තැනැත්තා යම් පාරිශ්‍රමිකයක් ලැබුයේ වුව ද නොලැබුයේ වුව ද" යන වචන ආදේශ කිරීමෙන්.

**10.** 1978 මාර්තු මස 30 වන දින අංක 310/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද හා සංශෝධිත 1978 මාර්තු මස 29 වන දින දරන අධිකාර පත්‍රය මගින්, ජනාධිපතිවරයා විසින් පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත මේ පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පැවරී ඇති සියලු බලතල, කටයුතු සහ වරප්‍රසාද දිගටම ඇරීමට හා ක්‍රියාත්මක කිරීමට සහ කිරීමට ඒ කොමිෂන් සභාවට හිමිකම තිබිය යුතු අතර, පරිහාර හා වරප්‍රසාද සම්බන්ධයෙන් සහ ඒ කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටින හෝ ඒ කොමිෂන් සභාවට සහාය වන හෝ සාක්ෂිකරු වන සහ වෙනත් තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ විධිවිධාන ඇතුළුව, ප්‍රධාන ප්‍රඥප්තියේ සියලු විධිවිධාන ඊට අදාළ විය යුතු ය. තවද මේ පනත ක්‍රියාත්මකව තිබුණි නම් දීමට, කිරීමට හෝ නිකුත් කිරීමට යම් අධිකරණයකට අධිකරණ බලය නොතිබිය දී, ඒ අධිකරණය විසින් දෙන ලද, කරන ලද හෝ නිකුත් කරන ලද යම් නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ රිට් ආඥාවක් ශූන්‍ය හා බල රහිත විය යුතු ය. තව ද ඒ අනුව, අභියාචනාධිකරණය විසින් අංක 1/78 දරන ඉල්ලීම සම්බන්ධයෙන් දෙන ලද නඩු තීන්දුව හා නිකුත් කරන ලද රිට් ආඥාව ඇතුළුව එවැනි යම් අධිකරණයක් විසින් දෙන ලද යම් නඩු තීන්දුවක්, කරන ලද යම් තීන්දු ප්‍රකාශයක් හෝ නිකුත් කරන ලද රිට් ආඥාවක් ශූන්‍ය හා බලරහිත බව ද එහි කවර වූ හෝ බලයක් හෝ බලපෑමක් නොවිය යුතු බව ද මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අභියාචනාධිකරණය විසින් දෙන ලද නඩු තීන්දුව සහ නිකුත් කරන ලද රිට් ආඥාව වලංගු නොවිය යුතු බව.

**11.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැනවීමට පෙර පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල සහ 12 වන වගන්තියේ කර ඇති සෑම සඳහන් කිරීමක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ කර ඇති සඳහන් කිරීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් විය යුතු බව.

**12.** ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයෙහි මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව—

මේ පනත අතීතයට බලපෑම.

(අ) 1978 මාර්තු මස 30 වන දින අංක 310/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද හා සංශෝධිත 1978 මාර්තු මස 29 වන දින දරන අධිකාර පත්‍රය මගින් ජනාධිපතිවරයා විසින් පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ට විරුද්ධව අංක 1/78 දරන ඉල්ලීම සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් දෙන ලද නඩු තීන්දුව කෙසේ වුව ද, ඒ කොමිෂන් සභාව සියලු කාර්ය සඳහා ද සියලු කල්හි ද වලංගුව හා බල සහිතව පැවති බව හා පවතින බව සලකනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වූ දිනයට පෙර, ඉහත කී කොමිෂන් සභාව විසින් හෝ එය ඉදිරියෙහි පවත්වන ලද හෝ කරන ලද සියලු පරීක්ෂණ කටයුතු හා එය විසින් කරන ලද සියලු නියම, තීන්දු, නිශ්චය කිරීම්, තීරණ සහ නිර්දේශ හා එකී කොමිෂන් සභාව විසින් කරන ලද වෙනත් සියලු ක්‍රියා සහ දේ, ඉහත කී නඩු තීන්දුව හා තහනම් රිට් ආඥාව කෙසේ වුව ද, මේ පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙන් එකී කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ කොමිෂන් සභාව විසින් වලංගු ලෙස කරන ලද සේ සලකනු ලැබිය යුතු ය ;

(ඇ) මේ පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙන් හෝ එය යටතේ හෝ පවරා ඇති සියලු බලතල, පරිහාර හා වරප්‍රසාද වලංගු ලෙස පවරා ඇති බව සියලු කාර්ය සඳහා ද සියලු කල්හි ද සලකනු ලැබිය යුතු ය ;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වූ දිනයට පෙර හෝ පසුව හෝ වුව ද පවරන ලද කවර වූ හෝ පරීක්ෂණ කටයුතුවලින් පැන නැගෙන්නා වූ හෝ යම් ඉල්ලීමකට නැතහොත් සිවිල් හෝ අපරාධ නඩුවකට අදාළ වන්නා වූ හෝ සියලු කාරණා මේ පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.